# එයිට්කන්ස් ස්පෙන්ස්
# ඒකාබද්ධ තිරසාරත්ව ප්‍රතිපත්තිය

ව්‍යාපාරයේ දිගුකාලීන ශක්‍යතාව, ලාභදායීත්වය සහ අඛණ්ඩතාව සාක්ෂාත් කිරීම සම්බන්ධයෙන් වූ පෙරටුගාමී ප්‍රවේශයක් ලෙස ඒකාබද්ධ පැවැත්ම පිළිබඳ සංකල්පය අපි අවබෝධ කරගෙන සිටින්නෙමු. රටවල් ගණනාවක ක්‍රියාත්මක වන බහුවිධ ව්‍යාපාරික කණ්ඩායමක් වශයෙන්, කල් පවත්නා සංවර්ධනය සම්බන්ධයෙන් වූ විශ්වීය අභිලාෂයන් සහ ඇගයීම් සමඟ අපගේ ක්‍රමෝපායන් හා අනුගත වෙමින් ආදර්ශවත් හා සාමූහික පුරවැසියන් වශයෙන් අපගේ කර්තව්‍යය අඛන්ඩව ඉටු කිරීමට අපි කැපවී සිටින්නෙමු.

## <u>ප්‍රතිපත්ති ප්‍රකාශය</u>

එයිට්කන් ස්පෙන්ස් හී අපේක්ෂාවන් වනුයේ -

A. තිරසර මෙහෙයුම් සමඟ අපගේ සමාගම සංවර්ධනය කිරීම සඳහා හේතුකාරක වන නෛතික සහ නියාමන අවශ්‍යතාවන්හී වඩාත් හොඳ පරිචයන් අත්පත් කර ගැනීමට හැකි පාලන ව්‍යුහයක් ඇති කිරීම සහ පවත්වාගෙන යාම,

B. තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම සඳහා පහසුකම් සැලසීම සහ එක්සත් ජාතීන්ගේ විශ්ව සම්මුතියේ මූලධර්ම දහය, කාන්තාවන් බලගැන්වීමේ ප්‍රතිපත්ති, සහ සමාගමේ අනෙකුත් ස්වේච්ඡා අනුමැතීන් අදාළ කර ගැනීම තවදුරටත් ශක්තිමත් කිරීම,

C. සදාචාරාසම්පන්න ලෙස ව්‍යාපාරික කටයුතු සිදු කිරීම සහ ආචාරශීලී ලෙස ව්‍යාපාරික කටයුතු සිදුකිරීම සඳහා අපගේ හවුල්කරුවන් දිරිමත් කිරීම සහ සහාය සැලසීම,

D. සංවිධානාත්මක මෙහෙයුම් කටයුතු වලදී පාරිසරික කළමනාකරණ පද්ධතීන් භාවිතය සහ දැඩි පාරිසරික බලපෑම් ඇතිවිය හැකි ක්‍රියාකාරකම් වලක්වාලීම පිණිස පියවර ගැනීම,

E. දේශගුණික විපර්යාස සහ අනෙකුත් ආපදා තත්වයන්ගෙන් සංවිධානයේ මෙහෙයුම් කටයුතු වලට සහ හවුල්කරුවන්හට ඇතිවිය හැකි බලපෑම් හඳුනාගැනීම සහ ඒවා අවම කිරීම සහ ඊට අනුවර්තනය වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම,

F. හවුල්කරුවන් සමඟ එක්ව කටයුතු කිරීම සහ සැලසුම්කරණයේදී සහ මෙහෙයුම් කටයුතු වල අවශ්‍ය පියවරයන්හී දී ඔවුන්ගේ දායකත්වය සළකා බැලීම,

G. තිරසර ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සැපයුම් දාමයන් දිරිමත් කිරීම,

H. උපායමාර්ගික තීරණ ගැනීමේ දී සමාජමය සහ පාරිසරික පාලනයක් ස්ථාපිත කිරීම,

J. අදාළ වන අවදානම් තත්වයන් පිළිබඳ සැළකිල්ල යොමු කරමින් සංවිධානයේ මෙහෙයුම් කටයුතු වලදී තිරසර ක්‍රියාපටිපාටි භාවිතා කිරීම,

K. පාරිභෝගිකයන් වෙත සපයනු ලබන සැකසුම් සහ භාණ්ඩ හා සේවාවන් ආශ්‍රිත ප්‍රවර්ධීකරණයන්ට සහ නවෝත්පාදනයට අනුබල දීම,

L. ලාභදායීත්වය සහතික කරමින් පාරිභෝගිකයන් වෙත සපයනු ලබන නිෂ්පාදන , සේවා සහ වටිනාකම් වල ගුණත්වය අඛණ්ඩව වැඩිදියුණු කිරීම,

M. තිරසර ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති වලට හවුල්වීම සහ සේවක සහභාගීත්වය දිරිමත් කිරීම,

N. රැකියා නියුක්තිය සඳහා අවස්ථා සැපයීම මඟින් දේශීය ප්‍රජාව වෙත සහනය සැලසීම සහ හැකි සෑම අවස්ථාවකදී ම දේශීය සැපයුම්කරුවන් වෙතින් මිලදී ගැනීම,

O. සේවකයන් වෙත ආරක්ෂාව සහ සෞඛ්‍ය තත්වය සහතික කළ වැඩ පරිසරයක් සැපයීමේ පදනම වශයෙන් රැකියාව ආශ්‍රිතව සෞඛ්‍යය සහ ආරක්ෂාව කළමනාකරණය කරනු ලබන ක්‍රියා පිළිවෙත් භාවිතා කිරීම,

P. ශක්තිමත් සහ මනා අභිප්‍රේරණ හැකියාවන්ගෙන් යුක්ත, තරගකාරී මානව සම්පතකින් සන්නද්ධ වීම,

Q. අන්තර්ජාතික වශයෙන් ප්‍රකටව ඇති මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තවදුරටත් තහවුරු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම,

R. අන්තර්ජාතික වශයෙන් අනුමත කළ නිර්දේශයන්ට සමගාමීව කාර්යසාධන තොරතුරු කළමනාකරණය කිරීම සහ වාර්තා කිරීම,

S. අදාළ වන රෙගුලාසි, මාර්ගෝපදේශ, ප්‍රතිපත්ති කාර්ය රාමු සහ කර්මාන්තය ආශ්‍රිත ප්‍රමිතීන් හා අනුකූල වීම සහ සැලකිලිමත්වීම හරහා  සංවිධානයේ සංවේදී තොරතුරු සහ අපගේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ආරක්ෂා කිරීම,

AitkenSpence

T. සමාගමේ සන්නිවේදන කටයුතු වලදී; ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, ජනවාර්ගිකත්වය, සංස්කෘතිය හෝ සමාජ කණ්ඩායම් හෝ දේශපාලනික වශයෙන් පක්ෂග්‍රාහී වීම; සේවකයන් කෙරෙහි වෙනස් ලෙස සැලකීම; හෝ පීඩාකාරී ආකල්ප විදහා දැක්වීමෙන් වැළකීම,

U. සියලුම සතුන් මානුෂීය සත්කාරයක් අවශ්‍ය කෙරෙන සංවේදනශීලී සත්වයන් වශයෙන් සැලකීම සහ අපගේ මෙහෙයුම් කටයුතු වලදී සත්ව සුභ සාධනය දිරිගැන්වීම,

V. වාර්ෂික කාර්යසාධන සමාලෝචනය සහ සැලසුම්කරණය වැඩිදියුණු කිරීම.

**<u>ක්‍රියාත්මක කිරීම</u>**

මාර්ගෝපදේශ සකස් කිරීම සහ නියෝග පැනවීම සම්බන්ධයෙන් එයිට්කන් ස්පෙන්ස් පී එල් සී හී අධ්‍යක්ෂ මණ්ඩලය, අධීක්ෂණ මණ්ඩලය, කළමනාකරණ මණ්ඩලය සහ ප්‍රවර්තනීය කමිටුව වගකීම දරනු ලැබේ.

ක්‍රියාත්මක කිරීමේ සහ පැහැදිලි කිරීමේ සටහන් වල සෑම පියවරක්ම සම්බන්ධයෙන් ක්‍රියාකාරී ක්ෂේත්‍රයන් ඇතුලත් කාර්යරාමුවක් ද අභ්‍යන්තර වශයෙන් බෙදා හැරීම සඳහා වන ප්‍රතිපත්ති ප්‍රකාශය සමග ලබා දෙනු ඇත.

කර්මාන්තය වෙත ඇති අදාළත්වය මනසේ රදවාගෙන ක්‍රියාත්මක කිරීමේ පද්ධතීන් හරහා ක්‍රමානුකූලව ප්‍රතිපත්ති වලට අනුකූල වීම සම්බන්ධයෙන් උපාය මාර්ගික ව්‍යාපාරික ඒකක කටයුතු කරනු ඇත. සංවිධානයේ මෙහෙයුම් කටයුතු වල ස්වභාවය සහ පරිමාණය සම්බන්ධයෙන් සමාජ, පාරිසරික සහ ආර්ථික පාලන ප්‍රමුඛතා සපුරාලීමට අවශ්‍ය කාර්යරාමු සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි සහ පරිචයන් හරහා කාර්යයන් ඉටු කිරීමේදී සෑම උපායමාර්ගික ව්‍යාපාරික ඒකකයක්ම විසින් නායකත්වය ඉසිලීම අපේක්ෂා කෙරේ.

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසනු වස් අවශ්‍ය අවස්ථාවන්හීදී දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් ආරම්භ කරනු ඇත.

සමාලෝචිත දිනය: **26.10.2018**

(ආසන්නම පූර්ව සමාලෝචනය: 22.09.2017)